සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – First Term Test – June 2021
පළමු වාර පරීක්ෂණය - 2021 ජූනි - 11 ශ්‍රේණිය

කාලය : පැය 1
**Time :1 hour**

| 40 | S | I |
|---|---|---|

## Oriental Music – I
## පෙරදිග සංගීතය – I

Name :- .................................................... Grade : -................ Index number:-...................

❖ **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

● **පහත සඳහන් වගුව ඇසුරින් 1 සිට 5 දක්වා ප්‍රශ්න පිළිතුරු සපයන්න.**

| රාගය | වාදී සංවාදී ස්වර | මුඛ්‍යාංගය |
|---|---|---|
| බිලාවල් | ධ ග | ග ප ධ නි ස̣ නි ධ ප ම ග |
| යමන් | ග නි | නි̣ රි ග රි ස, ප ම’ග රි ස |
| කාෆි | ප ස | සස රිරි ග̱ ග̱ මමප- |
| භූපාලි | ග ධ | ගරි සධ̣ සරිග පගධපගරිස |
| භෛරවී | ම ස | මග̱ සරි̱ ප̱ ධ̱̣ නි̱̣ ස |

1. බිලාවල් රාගයේ අනුවාදී ස්වර වන්නේ,
   (1) ස රි ප නි (2) රි ග ප ම ධ (3) ස රි ප ම නි (4) රි ම ධ නි ස

2. භූපාලි රාගයේ වර්ජ ස්වර දෙක වනුයේ,
   (1) ස ම (2) ම නි (3) නි ස (4) රි ප

3. මධ්‍යම රාත්‍රී හෙවත් රාත්‍රී 2 වන ප්‍රහරයේ දී ගයනු ලබන රාගයක වාදී සංවාදී වනුයේ,
   (1) ධ ග (2) ග න (3) ම ස (4) ප ස

4. වගුවෙහි රාග අතරින් බැති ගීයක නාද මාලාවක් සැකසීමට ආශ්‍රය කරගත හැකි වඩාත් උචිත රාගය කුමක් ද?
   (1) භූපාලි (2) කාෆි (3) භෛරවී (4) යමන්

5. පියාකී නජරියා යන මධ්‍යලය ගීතය ඇතුළත් රාගය වන්නේ,
   (1) යමන් (2) බිලාවල් (3) කාෆි (4) භෛරවී

6. රාගයට අදාළ වාදී සංවාදී ගායන සමය ආදී විස්තර කියවෙන ගීත හඳුන්වනු ලබන්නේ,
   (1) සර්ගම් ගී (2) මධ්‍යලය (3) විලම්භය ගී (4) ලක්ෂණ ගී

7. සර්ගම් ගීතයක අත්‍යවශ්‍යයෙන් ම තිබිය යුතු අංශය වන්නේ,
   (1) රිද්මය යි. (2) කාලය යි. (3) ස්වරය යි. (4) ශ්‍රැතිය යි.

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

8. තබ්ලා වාදනයේ දී ස්වර වාද්‍ය භාණ්ඩයකින් සහාය වාදනය කිරීම හඳුන්වනු ලබන්නේ,
   (1) ආලප වාදනය නමිනි. (2) ලෙහෙරා වාදනය නමිනි.
   (3) ජාලා වාදනය නමිනි. (4) ගත් වාදනය නමිනි.

9. තබ්ලා වාදනයේ දී දක්නට නොලැබෙන අංගයකි,
   (1) තබ්ලාව යි. (2) මුඛඩා (3) රේලා (4) පල්ටා

10. ද්‍රිං ත්‍රං ත්‍රං | ග්‍රති ත්‍රග තං | යන පදය වැයීමට වඩාත් සුදුසු භාණ්ඩය වන්නේ,
   (1) තබ්ලාව යි. (2) මෘදංගය යි. (3) දවුල යි. (4) මද්දලය යි.

11. ස්වර පුවරු භාණ්ඩයක් වූ ද, තත් සම්බන්ධ වීමෙන් හඬ නිපදවෙන භාණ්ඩය කුමක් ද?
   (1) එකෝඩියන් (2) මෙලෝඩිකා (3) සර්පිනාව (4) පියානෝව

12. වයලීනයේ තත් බටහිර සංගීතයට අනුව නම් කර ඇත්තේ පිළිවෙළින්,
   (1) G E D A වශයෙනි. (2) G D A E වශයෙනි.
   (3) G A D E වශයෙනි. (4) G E A E වශයෙනි.

13. ස්වර පිහිටීම අතින් සමාන භාණ්ඩ යුගලයකි,
   (1) වයලීන් - චෙලෝ (2) මෙලෝඩිකා - දිල්රුබා
   (3) සිතාර් - එස්රාජ් (4) සිතාර් - වීණා

14. තාල රූප දෙකකින් ගැයෙන සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් වන්නමකි,
   (1) සැවුලා (2) ආනන්ද (3) කෝකිල (4) උකුසා

15. කපිරිඤ්ඤා සංගීතය ලංකාවේ ව්‍යාප්ත වීම සඳහා බලපාන ලද්දකි,
   (1) ලන්දේසි පැමිණීම (2) ඉංග්‍රීසි පැමිණීම
   (3) සොළීන් පැමිණීම (4) පෘතුගීසි පැමිණීම

16. සරල ගීතයට පෙරවාදනය හඳුන්වන නම කුමක් ද?
   (1) Interlude (2) Chorus (3) Introduction (4) Verse

17. සේ ගීත පිළිබඳ වැරදි කියමන තෝරන්න.
   (1) උගතුන් විසින් රචනා කර තිබේ. (2) භාෂාවේ සංකීර්ණ බවක් දක්නට ඇත.
   (3) කර්තෘ අවිනිශ්චිතයි. (4) අර්ථාන්විත බවකින් යුක්තයි.

18. විවෘත හඬකින් එළිමහනේ කණ්ඩායම් වශයෙන් අඩු ලයකින් ආරම්භ කර වැඩි ලයකින් අවසන් වන සේ ගයනු ලබන ගීත විශේෂය,
   (1) ඨුම්රි (2) කව්වාලි (3) ගසල් (4) භජන්

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

19. ''නොපෙනෙන දෙවියන් වැන්දේ ඇයි ඔබ'' යන පද කොට ඇතුළත් සරල ගීතය තෝරන්න.

(1) ගමට කලින් හිරු (2) අම්මාවරුනේ

(3) මිහිමඬලේ අඳුරු කුසේ (4) සොම්නස හෝ සංතාපය

20. මී වදයකි ජීවිතේ... යන ගීතය නිර්මාණයේ දී ආභාසය ලබාගත් ගායනා ශෛලියකි,

(1) ගසල් (2) කපිරිඤ්ඤා (3) කව්වාලී (4) ඨුම්රි

● **අංක 21 සිට 25 දක්වා ප්‍රශ්න සඳහා පහත සංගීත භාණ්ඩ ඇසුරින් පිළිතුරු සපයන්න.**




21. විතානත ඝනයට අයත් සංගීත භාණ්ඩය ඇත්තේ කුමන රූප සටහනෙහි ද?

(1) A (2) B (3) C (4) D

22. පොකුරු බෙරය නමින් හඳුන්වන සංගීත භාණ්ඩය අයත් රූප සටහන වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

23. කෝලම් නාට්‍ය සඳහා භාවිත කරන තාල වාද්‍ය භාණ්ඩය ඇතුළත් වන්නේ කුමන රූප සටහනෙහි ද?

(1) A (2) B (3) C (4) D

24. B රූප සටහනෙහි ඇති සංගීත භාණ්ඩය යොදා ගනු ලබන්නේ,

(1) නූර්ති නාට්‍ය සඳහා (2) උඩරට සංගීතය සඳහා

(3) ශාන්තිකර්ම සඳහා (4) නාඩගම් නාට්‍ය සඳහා

25. දේශීය භාණ්ඩ වර්ගීකරණයට අදාළ රූප සටහන් ඇති පිළිතුර තෝරන්න.

(1) A B C (2) A C E (3) B C D (4) C D E

26. ගැමි ගීය තුළ අඬහැර පාන අවස්ථාවක් ලෙස නම් කළ හැක්කේ,

(1) කුඹුරේ සීසාන විට (2) කුඹුරු වල් නෙලන විට

(3) කමත් ගී ගයන විට (4) කුළු ගී ගයන විට

27. ''බුම්මැඩිය'' බොහෝ විට භාවිත කරනු ලබන්නේ,

(1) කුඹුරේ වතුර හරවන විට (2) නෙළුම් ගී ගයන විට

(3) කමත් ගී ගයන විට (4) කුළු ගී ගයන විට

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

28. වන්නමක් ආභාසයෙන් නිර්මාණය වූ සරල ගීතයක් වන්නේ,

(1) සකිය සගව්වට රෝදය (2) මේ අවුරුදු කාලේ

(3) රුක් අත්තන මල මුදුනේ (4) රෑ පැල් රකින

29. රජවරුන්ගේ ගුණ වර්ණනා ඇතුළත්ව සකස් වී ඇති ප්‍රශස්ති ගීත හඳුන්වනු ලබන්නේ,

(1) බුද්ධ ප්‍රශස්ති (2) භූත ප්‍රශස්ති (3) රාජ ප්‍රශස්ති (4) දේව ප්‍රශස්ති

30. වන්නම් හා ප්‍රශස්ති ආරම්භ වූයේ මහනුවර යුගයේ රාජ සභාව තුළ පිහිටුවා තිබූ,

(1) වාහල ඉලංගම මගිනි. (2) සංගීතය ඉලංගම මගිනි.

(3) සිංගාරක්කාර අංශය (4) කවිකාර මඩුව

31. සොකර නාට්‍ය පිළිබඳ වැරදි කියමන තෝරන්න.

(1) සොකරි යනු රූමත් කාන්තාවකි.

(2) සොකරි නාට්‍ය උඩරට හා වන්නි ප්‍රදේශයේ ප්‍රචලිතව පැවතිණි.

(3) සශ්‍රීකත්වය අරමුණු කරගත් ශාන්තිකර්මයකි.

(4) සොකරි නිතරම කංසා බී උඩුකුරුව සයනේ සිටින කාන්තාවකි.

32. කුමට ද සොබනියෙ කඳුළු සලන්නේ.... යන ගීතය ඇතුළත් නාට්‍ය නිෂ්පාදනය කරන ලද්දේ,

(1) මහාචාර්ය සරච්චන්ද්‍රයන් විසිනි. (2) දයානන්ද ගුණවර්ධනයන් විසිනි.

(3) ප්‍රේමසිරි කේමදාසයන් විසිනි. (4) ලූෂන් බුලත්සිංහලයන් විසිනි.

33. ගැමි ගී ගණයට අයත් නොවන්නේ,

(1) වන්නම් (2) ගොයම් ගී (3) ලී කෙළි ගී (4) ටීකා සීපද

34. මාලදිවයින් ජාතික ගීයේ සංගීත නිර්මාණය කළ ශ්‍රී ලාංකික සංගීතඥයා වනුයේ,

(1) සුනිල් ශාන්ත සූරීන් (2) ආනන්ද සමරකෝන් සූරීන්

(3) බී.එස්. පෙරේරා සූරීන් (4) පණ්ඩිත් අමරදේව සූරීන්

35. සරල ශාස්ත්‍රීය ගීතයක් වශයෙන් සලකනු ලබන ගීතය තෝරන්න.

(1) ඉරෙන් හඳෙන් (2) කඳුළු හෙලා නෑඹිලියට

(3) හෝ පලු වන පෙත (4) දවසක් පැල නැති හේනේ

36. 

මෙම සංකේතයෙන් ප්‍රකාශ වනුයේ,

(1) Treble clef ය. (2) Key signature ය.

(3) Rest Mark ය. (4) Bass clef ය.

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

37. Dotted Notes එකක දී සිදු වන කාර්යය වනුයේ,

(1) මාත්‍රාවේ වටිනාකම දෙගුණ වීම යි.

(2) මාත්‍රාවේ වටිනාකම 1/2 කින් අඩුවීම යි.

(3) මාත්‍රාවේ වටිනාකමෙන් අඩක් මුල් වටිනාකමට එකතුවීම යි.

(4) මාත්‍රාවේ වටිනාකම කිසිදු වෙනසක් සිදු නොවීම යි.

38. Electric Guitar භාවිතයේ දී Bass Guitar එකක කාර්ය වන්නේ අදාළ ගීතයට ගැළපෙන අයුරින්,

(1) අදාළ කෝඩ්ස් වාදනය කිරීම යි.

(2) ගීතයට අදාළ ස්වර වාදනය යි.

(3) ගීතයට අදාළ වන සේ සැකසූ මන්ද්‍ර ස්වර රිද්මයකට වාදනය කිරීම යි.

(4) අදාළ කෝඩ්ස් හා ස්වර යන දෙවර්ගය ම වාදනය කිරීම යි.

39. තාද වාදනයට සඳහා ව්‍යවහාරික සංගීතය තුළ වර්තමානයේ බහුලව ම භාවිත කරන බටහිර සංගීත භාණ්ඩය,

(1) Bass drum (බේස් ඩ්‍රම්) (2) Side drum (සයිඩ් ඩ්‍රම්)

(3) Tenor drum (ටෙනර් ඩ්‍රම්) (4) Octapad (ඔක්ටපෑඩ්)

40. සංගීත ප්‍රසංගයක දී හෝ විවිධ ප්‍රසංග අවස්ථාවක දී ශබ්දය වැඩි කිරීම සඳහා යොදාගනු ලබන උපකරණය වන්නේ,

(1) ඇම්ප්ලිෆයර් (2) මික්සර් (3) මයික්‍රපෝනය (4) ස්පීකර්

(ලකුණු 1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – First Term Test – June 2021
## පළමු වාර පරීක්ෂණය - 2021 ජුනි - 11 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2 hours

| 40 | S | II |
|---|---|---|

## Oriental Music – II
## පෙරදිග සංගීතය – II

Name :- .................................................... Grade : -................ Index number:-....................

❖ **පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(1) කෙටි පිළිතුරු සපයන්න.

(i) රි ගු̲ රි ම ගු̲ රි ස වශයෙන් ස්වර සංගතිය යෙදෙන්නේ කුමන රාගයේ ද?

(ii) xx I xxx මේ ලෙස මාත්‍රා බෙදිය හැකි හින්දුස්ථානි තාලය කුමක් ද?

(iii) ම හා නි. ස්වර වර්ජිත රාගය කුමක් ද?

(iv) නූර්ති නාට්‍ය සඳහා යොදාගන්නා ලද ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය කුමක් ද?

(v) 'උරුට්ටුව' නම් සංගීතාංගය දැකිය හැකි රංග ශෛලිය කුමක් ද?

(vi) විතතානත ඝණයට අයත් සංගීත භාණ්ඩයක් නම් කරන්න.

(vii) පහතරට නර්තන සම්ප්‍රදායට අයත් වන්නම් ගණන කීය ද?

(viii) ''සබේ විදානේ'' චරිතය ඇතුළත් රංග ශෛලිය නම් කරන්න.

(ix) ''සත් සමුදුර'' චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂවරයා හා එම ගීතයේ ගායකයා නම් කරන්න.

(x)  මෙම සංකේතයේ නම කුමක් ද? එහි වටිනාකම මාත්‍රා කීය ද?

(2) පහත සඳහන් ස්වර සංගතිය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

A - නි̣ රි ග රි ස - නි̣ ධ̣ නි̣ රි ස

B - ස නි̣̲ ධ̣̲ නි̣̲ ස - ස රි̲ ස

C - ග රි ස ධ̣ - ස ග

(i) ඉහත සඳහන් රාග තුන පිළිවෙළින් නම් කරන්න.

(ii) ඉහත රාග තුනෙන් ඔබ කැමති රාගයකට අදාළ මධ්‍යලය ගීතය ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

(iii) ඔබ ප්‍රස්තාර කරන ලද රාගයේ
ථාටය, ආරෝහණ, අවරෝහණ, ගායන සමය වාදී සංවාදී ලියා දක්වන්න.

(3) පහත සඳහන් ගී පාද ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – උදයට පායන හිරු දෙවියන්ටයි  B – දොඩම් කපාලා

C – බුද්ධං සරණේ  D – රූ රැසේ අඳිනා ලෙසේ

(i) ඉහත ගීත අයත් ගී වර්ගය නම් කරන්න.

(ii) B හා C ගී වර්ග දෙක අතර ඇති සම විෂමතා දෙක බැගින් ලියන්න.

(iii) A නම් ගීත වර්ගයට අයත් ගීතයක පද ප්‍රස්තාර කරන්න.

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

(4) ධ̣ ප̣ ධ̣ | ස - රි | ග - ධ | ප - ප

ග ග රි | ස - රි | සරි ගරි | ස - -

(i) ඉහත සඳහන් ගී පාදය බටහිර ක්‍රමයට ප්‍රස්තාර කරන්න.

(ii) බටහිර සංගීත ස්වර ප්‍රස්තාරකණයේ දී භාවිත කරන පහත සංකේත කෙටියෙන් පැහැදිලි කරන්න.

𝅝 𝅗𝅥. ♯ ♮

(iii) බටහිර සංධ්වනි නිර්මාපකයින් දෙදෙනෙක් නම් කරන්න.

(5) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) තබ්ලාවේ දල රූප සටහනක් ඇඳ එහි කොටස් 04 ක් නම් කරන්න.

(ii) දායාවෙන් හා බායාවෙන් උපදින අක්ෂර 2 බැගින් වෙන් වෙන්ව ලියා දක්වන්න.

(iii) තබ්ලාවෙන් වාදනය කළ හැකි මාත්‍රා 8 කින් යුත් තාලය නම් කර නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.

(6) පහත සඳහන් කරුණුවලට අදාළව පිළිතුරු සපයන්න.

- "දොහොරාව" නම් ගායන අංගය ඇතුළත් ය.
- මද්දල දෙකක් භාවිත කරයි.
- පිලිප්පු සිඤ්ඤෝ මහතාගේ පුරෝගාමිත්වය මෙරට ව්‍යාප්තියට බලපෑවේ ය.
- තබ්ලාව, සර්පිනාව, වයලීනය යොදා ගනී.
- රොලීනා ප්‍රථම නාට්‍යය යි.
- නීතිඥ ජෝන් ද සිල්වා මහතාගේ දායකත්වය ලැබුණි.

(i) මෙම තොරතුරුවලට අයත් රංග සම්ප්‍රදායන් දෙක නම් කරන්න.

(ii) මෙම රංග සම්ප්‍රදායන් ආභාසය ලබා ඇති සංගීත සම්ප්‍රදායන් දෙක නම් කරන්න.

(iii) මෙම සම්ප්‍රදායන් දෙකට අයත් නාට්‍ය දෙක බැගින් නම් කරන්න.

(iv) එම එක් සම්ප්‍රදායකට අයත් ගීතයට මුල් කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

(7) පහත සඳහන් මාතෘකාවලින් දෙකක් ගැන කෙටි සටහන් ලියන්න.

| A | B | C |
|---|---|---|
| විසෙහි විස සඳහා ලෝකේ | වෙසක් කැකුළු අතු අග හිඳ | කරුණා නදියේ පැද යාමු |
| දුල් සල්වනේ ලකල් | ඔංචිල්ලා තොටිලි කොයින්දෝ | අක්කෙ අක්කෙ අර බලන්නකෝ |
| ඇසේ මධුර ජීවනයේ ගීතා | සිනිඳු සුදු මුදු තලාවේ | ලංකා ලංකා පෙම්බර ලංකා |

(i) ඉහත වගුවට අනුව A, B, C තීරුවලට අයත් ගී වර්ග නම් කරන්න.

(ii) C තීරුවට අයත් ගීත ගායනා කර ඇති ගායකයින් දෙදෙනා නම් කර ඉන් එක් පුද්ගලයෙකු පිළිබඳව තොරතුරු ටේයෙන් ලියන්න.

(iii) සත් සමුදුර චිත්‍රපටයේ තේමා ගීතය පිළිබඳ සුවිශේෂී තොරතුරු 4ක් ලියන්න.